# තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

## 3 සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රයේ(අව්‍යවහිත හා ව්‍යවහිත)අනුමාන ඇසුරෙන් සප්‍රමාණ නිගමනවලට එළඹෙයි.

**3.1 අව්‍යවහිත අනුමාන දෛනික ජීවිතයේදී ප්‍රායෝගිකව යොදාගත හැකි බව ආදර්ශනය කරයි.**

**(පැවරුම්)**



## පැවරුම

01. (අ) පහත ප්‍රකාශයන්ට අදාල ප්‍රස්තුත ප්‍රතියෝග නම් කරන්න

1.ප්‍රස්තුත යුගලයේ අඩු තරමින් එක ප්‍රස්තුතයක්වත් සත්‍ය වේ.

2.ප්‍රස්තුත යුගලය එකවර සත්‍ය විය නොහැකි නමුත් අසත්‍ය විය හැකිය.

3.ප්‍රස්තුත යුගලයෙන් වරකට සත්‍ය හෝ අසත්‍ය වන්නේ එකක් හෝ එකක් පමණි.

4.ප්‍රස්තුත යුගලය එකවර සත්‍ය මෙන්ම අසත්‍ය විය හැකිය.

(ආ) නිදසුන් දෙමින් ප්‍රත්‍යනික ප්‍රතියෝගය පැහැදිලි කරන්න.

02. (අ) ප්‍රස්තුත ප්‍රතියෝගයට අදාල පහත දැක්වෙන හිස්තැන් සත්‍ය, අසත්‍ය, අවිනිශ්චිත යන පදවලින් සුදුසු පදය යොදා සම්පූර්ණ කරන්න.

1. A ප්‍රස්තුතය අසත්‍ය වන විට E________ I ________O _______

2.E ප්‍රස්තුතය අසත්‍ය වන විට A________ I ________O _______

3.I ප්‍රස්තුතය අසත්‍ය වන විට A________ E ________O _______

4.O ප්‍රස්තුතය අසත්‍ය වන විට A________ E________I _______

(ආ) ප්‍රස්තුතයක වාච්‍ය උදෙසා වූ වස්තු වර්ගය සැබවින්ම ලොව නොපවතින විටදී ප්‍රතියෝග අනුමානයන්හි වලංගුභාවය පිළිබඳ ගැටළුව **සියළු ඔළුතුනෝ බූරුවන් ක්ෂීරපායින් වේ.** යන ප්‍රස්තුතය ඇසුරෙන් පැහැදිලි කරන්න.



අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .

පරිගණක පිටු සැකසුම : එම්.කේ.ඩබ්ලිව්.නේමින්දා වික්‍රමරත්න මෙය,හ/ජඳුර විද්‍යාලය අඟුණුකොලපැලැස්ස

Copyright © www.e-thaksalawa.moe.gov.lk

03. (අ) පහත සඳහන් ප්‍රකාශයන්ට අදාල ආනයනයන් නම් කරන්න.

1.දෙන ලද ප්‍රස්තුතයේ වාචකයේ විසංවාදය අනුමිති ප්‍රස්තුතයේ වාච්‍ය වේ.

2.දෙන ලද ප්‍රස්තුතයේ වාච්‍ය සහ වාචකය අනුමිති ප්‍රස්තුතයේ හුවමාරු වී ඇත.

3.දෙන ලද ප්‍රස්තුතයේ වාචකයේ විසංවාදය අනුමිති ප්‍රස්තුතයේ වාචකය වේ.

4.දෙන ලද ප්‍රස්තුතයේ වාච්‍යයේ විසංවාදය අනුමිති ප්‍රස්තුතයේ වාච්‍ය වේ.

(ආ) වාච්‍ය (S) ක්ෂීරපායී, වාචකය (P) අවලතාපීන් වර්ග වශයෙන් ගෙන ගොඩනගාගත් A, E, I, O යන ප්‍රස්තුතයන්හි ප්‍රතිවර්තනයන් ලියා දක්වන්න.

04. (අ) පහත සඳහන් ප්‍රස්තුතයන් හි ප්‍රතිවර්ත්‍ය පරස්ථාපිතයන් ලියා දක්වන්න.

1.සියළු සිව්පාවුන් ක්ෂීරපායින් වේ.

2.කිසිම පක්ෂියෙක් නිශාචරයෙක් නොවේ.

3.සමහර පලතුරු කහපාට නොවේ.



අන්තර්ගතය සකස් කිරීම : ප්‍රීතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .

පරිගණක පිටු සැකසුම : එම්.කේ.ඩබ්ලිව්.නේමින්දා වික්‍රමරත්න මෙය,හ/ජඳුර විද්‍යාලය අඟුණුකොලපැලැස්ස

Copyright© www.e-thaksalawa.moe.gov.lk

(ආ)පහත සඳහන් ආනයන සප්‍රමාණ ද නිශ්ප්‍රමාණදයන්න සඳහන් කර සප්‍රමාණ නම් නිවැරදිව යොදාගෙන ඇති අනුමානයත් නිශ්ප්‍රමාණ නම් අභාසයත් සඳහන් කරන්න.

1. උගතුන් කිසිවෙක් රට හැර යන්නේ නැත. එහෙයින් රටහැර නොයන සියළු දෙනා උගතුන් වේ.
2. සියළු මිනිස්සු මැරෙන සුළුය.එහෙයින් නොමැරෙන සුළු සියළු දෙනා නොමිනිසුන් වේ.
3. සමහර නීතිඥයින් තර්ක කරන්නේ නැත. එහෙයින් සමහර තර්ක කරන්නවුන් නීතිඥයන් නොවේ.
4. සමහර ආනයනික භාණ්ඩ බද්දෙන් නිදහස්ය. එහෙයින් බද්දෙන් නිදහස් සමහරක් ආනයනික භාණ්ඩ නොවන ඒවා නොවේ.
5. පියාසර කරන කිසිවෙක් ක්ෂීරපායීන් නොවේ. එහෙයින් පියාසර නොකරන සියළු දෙනා ක්ෂීරපායින් වේ.
6. සියළු ආරක්ෂක නිලධාරීහු ආයුධ සන්නද්ධ වේ. එහෙයින් ආයුධ සන්නද්ධ නොවන සියළුදෙනා ආරක්ෂක නිලධාරීන් නොවන්නන් වේ.
7. උපාය දන්නා කිසිවෙක් අපායේ නොවැටේ. එහෙයින් අපායේ නොවැටෙන හැමෝම උපාය නොදන්නෝ නොවේ.
8. සියළු දේශප්‍රේමීන් ජාතිහිතෛෂීන් වේ. එහෙයින් ජාතිහිතෛෂීන් හැමෝම දේශප්‍රේමීන් නොවන්නෝ නොවේ.



අන්තර්ගතය සකස් කිරීම : ප්‍රිතිමා සෙනෙවිරත්න මිය, කෑ/ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය,කෑගල්ල .

පරිගණක පිටු සැකසුම : එම්.කේ.ඩබ්ලිව්.නේමින්දා වික්‍රමරත්න මෙය,හ/ජඳුර විද්‍යාලය අඟුණුකොලපැලැස්ස

Copyright © www.e-thaksalawa.moe.gov.lk